*සැ. යු.* - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,714 - 2011 ජූලි මස 08 වැනි සිකුරාදා - 2011.07.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1004 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1012 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ජා ඇල ප්‍රාදේශීය සභාව - කඳාන

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, ජාඇල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

*උපලේඛනය*

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | කර්මාන්ත පරිපාලක II ශ්‍රේණිය (මාර්ග සුළු පරිපාලක) | 01 | MN-1-2006 - A<br>රු. 13,120 - 10 x 145 - 11 x 170- 10 x 240 - 10 x 320 - 22,040/-<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ ගණිතය වාණිජ්‍ය අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම;<br>හෝ<br>ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් එක් වතාවකදී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම<br>හෝ<br>පළාත් පාලන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 08 වැනි ශ්‍රේණිය සමත්වීම;<br>II ශ්‍රේණියේ කර්මාන්ත පරිපාලක තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල පරීක්ෂණය මතය;<br>* සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය පැය 1 1/2<br>* සාමාන්‍ය දැනුම පරීක්ෂණය පැය 01<br>ආදී වශයෙන් වන ප්‍රශ්න පත්‍ර 2 කින් සමන්විත වේ. |
| 02. | මෝටර් කාර්මික III ශ්‍රේණිය | 01 | PL-3-2006 -A රු. 12,470 - 10 x 130-10 x 145 -10 x 160 - 12 x 170 -18,860/-<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී කුමන හෝ විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයන් දෙකක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත් වී තිබිය යුතුය);<br>සහ<br>තනතුරට අදාළ වසර 2 ක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.);<br>*වෘත්තීය සුදුසුකම්-*<br>වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම<br>*හෝ*<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTBT) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම<br>*හෝ*<br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහ සහතිකය ලබා තිබීම<br>*හෝ*<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීම් අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම; |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | *හෝ*<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>*හෝ*<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. මේ සඳහා බඳවා ගනු ලබන්නේ පහත පරිදි වූ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මතය.<br>***ලිඛිත පරීක්ෂණය .:***<br>පෙට්‍රල් හා ඩීසල් වාහනවල යාන්ත්‍රික උපාංග දෝෂ හඳුනා ගැනීම, උපාංග අළුත්වැඩියාව හා වාහන අළුත්වැඩියාව පිළිබඳ සියලු කටයුතු හා උපකරණ නඩත්තුව සම්බන්ධ පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 100)<br>***ප්‍රායෝගික පරීක්ෂණය :***<br>යන්ත්‍ර ක්‍රියාකරවීම, ගලවා සවි කිරීම, වෘත්තීයට අදාළව පැවරී ඇති කාර්යයන්වල කොටසක් ඉටු කිරීම ආදී වෘත්තියට අදාළ ප්‍රායෝගික කොටස් පිළිබඳ පරීක්ෂණ මණ්ඩලය වාචිකව ප්‍රශ්න විමසනු ලැබේ. (පැය1 1/2) (ලකුණු 100) |
| 03. | රියදුරු II "ආ" | | PL - 3- 2006-A<br>රු. 12,470 -<br>10 x 130 -10 x 145 - 10 x 160 -<br>12 x 170 - 18860<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසැලක අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත්වී සිටිය යුතුය.<br>***වෘත්තීය සුදුසුකම් .-***<br>පෞද්ගලික/කුළී රථ සහ තාර බර හොණ්ඩර විසිහතරකට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාළ සහතික ලබා තිබිය යුතු ය.)<br>වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය.<br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.<br>*වෙනත් සුදුසුකම් .-*<br>අවම උස අඩි 5කට වැඩි විය යුතු ය.<br>දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>පවත්වනු ලබන ලිඛිත ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ. |
| 04. | සුසානභූමි භාරකරු | 01 | PL - 1- 2006A<br>රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600<br>(දොලොස්වන වැටුප් පියවර ආරම්භක පියවර වේ.) | 08 ශ්‍රේණිය/09 වසර සමත්ව තිබිය යුතු ය. |
| 05. | ආදාහනාගාර ක්‍රියාකරු සහායක (ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 01 | PL - 1- 2006A<br>රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | 08 ශ්‍රේණිය/09 වසර සමත්ව තිබිය යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| 06. | විදුලි කම්බිකරු සහායක (ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 01 | PL - 1- 2006A<br>රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | 08 ශ්‍රේණිය/09 වසර සමත්ව තිබිය යුතු ය. තනතුරට අදාළ රාජකාරි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පිළිබඳ වාචික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. |
| 07. | විදුලි කම්බිකරු (කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණිය) | 01 | PL - 1- 2006A<br>රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | 08 ශ්‍රේණිය/09 වසර සමත්ව තිබිය යුතු ය. |
| 08. | පුස්තකාල කම්කරු (කා.සේ.සේ. III ශ්‍රේණිය) | 01 | PL - 1- 2006A<br>රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | 08 ශ්‍රේණිය/09 වසර සමත්ව තිබිය යුතුය. |
| 09. | මාර්ග කම්කරු (කා.සේ.සේ. III ) | 07 | PL - 1- 2006A<br>රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | යටත් පිරිසෙයින් 05 වන ශ්‍රේණිය සමත් විය යුතු ය. |
| 10. | සෞඛ්‍ය කම්කරු (කා.සේ.සේ. III ) | 03 | PL - 1- 2006A<br>රු.11,730-10x120-10x130<br>10x145-12x160-රු.17,600<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අධ්‍යාපන සුදුසුකම් බල නොපායි. |

*01. නියමිත තනතුරු සඳහා වෙනත් පොදු සුදුසුකම්.-*

1. අයදුම්පත් කැඳවන දිනට බස්නාහිර පළාත තුළ වසර 03 ක ස්ථිර පදිංචියක් ඇත්තෙකු විය යුතු ය.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත)
3. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ, පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම-*

1. සේවා අවශ්‍යතාවයට අනුව විභාග ප්‍රතිඵල මත/විධිමත් සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.
2. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2011.07.29 වැනි දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ජා ඇල ප්‍රාදේශීය සභාව, කඳාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් රාජ්‍ය , පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතු ය.)
3. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතු යි.
4. අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් එවිය යුතු ය.
    1. උප්පැන්න සහතිකය ;
    2. අධ්‍යාපන සහතික;
    3. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් සහතික කරගත් ග්‍රාමසේවක සහතිකය;
    4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබාගත් එකක් විය යුතු ය.);
    5. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-* මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

04. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ ඒ අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල ජාඇල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

05. අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී ලිඛිත විභාග සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (දෙමළ, ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට සැලකිය යුතුය.)

සුනිල් ප්‍රේමදාස,
ලේකම්,
ජාඇල ප්‍රාදේශීය සභාව.

2011 ජුනි මස 23 වැනි දින,
ජා ඇල ප්‍රාදේශීය සභා කාර්යාලය,
කඳාන.

*ආදර්ශ අයදුම්පත*

**ජාඇල ප්‍රාදේශීය සභාව**

**............................................................................................ *තනතුර සඳහා වූ අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
3. ස්ථිර ලිපිනය:——————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
6. උපන් දිනය :
   වර්ෂය:——————————. මාසය:——————————. දිනය:——————————.
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.
8. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග ? :——————————.
9. විවාහක/අවිවාහක බව:——————————.
10. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් :——————————.
    (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)
12. වෘත්තිය හා වෙනත් සුදුසුකම් :——————————.
    (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)
13. සේවා පළපුරුද්ද :——————————.
14. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම් එම වරදට ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න. :——————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

***දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය.***

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ........................................................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ........................................................................ ක වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත්, ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :——————————.
(නිල මුද්‍රාව යොදන්න.)
දිනය :——————————.

07-224

**මහරගම නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

මහරගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත දැක්වෙන තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුර හා වැටුප් පරිමාණය* — *අධ්‍යාපන සුදුසුකම්*

1. සුසාන භූමි කම්කරු III
මාසික රු. 11,730 - 10 x 120 -
10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (රා. ප. ච. 6/2006
( iv) හි PL-1-2006 - A) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර
කාර්යක්ෂමතා කඩ ඉමකි.
තනතුරු 1
— *(අ)* අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් වීම

2. මාර්ග කම්කරු III
මාසික : රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160
-රු.17,600 (රා.ප.ච. 6/2006) (iv) හි PL1- 2006 - A) හතරවන වැටුප්
පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.
තනතුරු 1
— *(ආ)* අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වැනි වසර සමත් වීම

3. සෞඛ්‍ය කම්කරු III
මාසික : රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160
රු.17,600 (රා. ප. ච. 6/2006 (iv) හි PL-1 - 2006 -A) හතරවන වැටුප්
පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.
තනතුරු 4
— *(ඇ)* අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ

02. *පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයින් විය යුතු යි.
(ii) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03 කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
(iv) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

03. *බඳවා ගන්නා ක්‍රමය :* රා. ප. චක්‍රලේඛ 24/95 විධි විධාන අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතයි. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක මුදල් ගෙවිය යුතු වේ.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලටද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධානවලටද, මහරගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරන ලද/ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*
මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2011.07.29 වැනි දිනට පෙර "ලේකම්, මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ..... තනතුර සඳහා අයදුම්පත (තනතුරේ නම) යනුවෙන් සඳහන් කළ යුතු ය.
(දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.)

ඊ. එල්. කේ. එරබද්ද මිය,
ලේකම්,
මහරගම නගර සභාව.

2011 ජුනි මස 20 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ - මහරගම නගර සභාවේ ........................................... තනතුරු සඳහා බඳවා ගැනීම***

01. මුලකුරු සමග නම :——————————.
මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.

02. ස්ථිර ලිපිනය :——————————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
04. දුරකථන අංකය :——————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
06. උපන් දිනය ඃ අවුරුද්ද :——————————. මාසය:——————————. දිනය:——————————.
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයසඃ අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
09. විවාහක/අවිවාහක බව :——————————.
10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද? :——————————. ලියාපදිංචිවීමෙන්ද? :——————————.
11. අධ්‍යාපන සුදුසුකම්:——————————.
(1) අවසන් වරට සමත් වූ ශ්‍රේණිය:——————————.
12. වෙනත් සුදුසුකම්:——————————.
13. සේවා පළපුරුද්ද:——————————.
14. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳ කොන්දේසි අනුව ම විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————————.

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන.................................. මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————.
දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියාගේ
හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන

දිනය :——————————.
පදවි නාමය හා ආයතනය:——————————.

07-207

---

**බේරුවල නගර සභාව**

බේරුවල නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාළ අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බේරුවල නගර සීමාව තුළ පදිංචි අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

| *අනු . අංකය* | *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *වැටුප් ක්‍රමය (මාසික වැටුප)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කර්මාන්ත පරිපාලන II ශ්‍රේණිය | 01 | රු. 13,120 - 145 x 10 - 170 x 11 - 240 x 10 -320x10-රු.22,040 | *(අ)* ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය,/ ගණිතය, වාණිජ්‍ය අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම; හෝ<br>*(ආ)* ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම; හෝ<br>*(ඇ)* පළාත් පාලන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණකර ඇතිනම් අටවන පංතිය සමත් වීම. |
| 02. | රෝල්ර් රියදුරු III ශ්‍රේණිය | 01 | රු.12,470 - 130 x 10 - 145 x 10-160 x10 -170x12-රු. 18,860 | *(අ)* ජාතික පොදු අධ්‍යයන සහිතක පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී කුමන හෝ විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතු ය. |

| අනු . අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් ක්‍රමය (මාසික වැටුප) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | (ආ) මෙම තනතුරට අදාළව අවම වශයෙන් වසර 02 ක පලපුරුද්දක් ලබා තිබීම (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.) (ඇ) පෞද්ගලික/කුලී රථ සහ තාරබර හොණ්ඩර 24 කට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුනතාව පිළිබඳ සහතිකයක් ලබා තිබීම |
| 03. | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 15 | රු. 11,730 -120 x 10 - 130 x 10 145 x 10 - 160 x 12 - රු.17,600 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්කරු බස්නාහිර පළාත තුල අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(iii) බේරුවල නගර සභා බල ප්‍රදේශයේ අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(iv) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බල නොපානු ඇත.).
(v) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතු ය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු කරනු ලැබූවකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු ය.
(vii) සේවා අවශ්‍යතාවයකි මත විධිමත් සම්මුඛ පරීක්ෂණයෙන් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
(viii) රෝලර් රියැදුරු බඳවා ගැනීමේ දී නිපුණතා පරීක්ෂණයකින් හා ලිඛිත පරීක්ෂණයකින් සමත් විය යුතු ය.
(ix) කර්මාන්ත පරිපාලක තනතුර සඳහා බඳවා ගැනීමේ දී ලිඛිත පරීක්ෂණයකින් සමත් විය යුතු ය. (ලිඛිත පරීක්ෂණය සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.)

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බේරුවල නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2011.07.30 දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම් බේරුවල නගර සභාව, බේරුවල " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ කෙළවරේ අදාල තනතුර සඳහන් කර ................................................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය යනුවෙන් සඳහන් කර එවිය යුතු ය.
(iii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

*(අ).* උප්පැන්න සහතිකය ;
*(ආ).* අධ්‍යාපන සහතික ;
*(ඇ).* පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය ;
*(ඈ).* මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක් ;
*(ඉ).* වෘත්තීය පලපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මා සතු ය.

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

තෝරා ගැනීම අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ජන අනුපාතය ද පදනම් කරගනු ඇත.

ජී. කේ. නිමල්,
ලේකම්,
බේරුවල නගර සභාව.

2011ක් වූ ජුනි මස 20 වැනි දින,
බේරුවල නගර සභාව,
බේරුවල.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*බේරුවල නගර සභාව*

*................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
02. තැපැල් ලිපිනය:——————————.
03. උපන් දිනය ඃ වර්ෂය:——————————. මාසය:——————————. දිනය:——————————.
04. අයදුම්පත් භාර ගන්නා දිනට වයස ඃ අවු. :——————————.මාස :——————————. දින:——————————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
06. විවාහක/අවිවාහක බව:——————————.
07. ජාතිය:——————————.
08. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද?—————————— එසේනම් පරම්පරාවෙන් ද/ලියාපදිංචියෙන් ද යන වග:——————————.
09. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා ඇත.) ඃ
  i. සමත් වූ වසර/ශ්‍රේණිය.:——————————.
  ii. අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ
  විභාග අංකය:——————————.
  විභාග වර්ෂය හා මාසය:——————————.
  සමත්වූ විෂයයන් ඃ

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6 | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9 | |
| 5. | | 10 | |

  iii. අ.පො.ස. (උ. පෙළ) විභාගය :
  විභාග අංකය :—————————— විභාග වර්ෂය හා මාසය :——————————.
  සමත් වූ විෂයයන් :

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

10. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවය කරන්නේ නම් සේවා විස්තර හා පත්වීමේ ස්වභාවය :——————————.
11. සේවා පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු වන....................................... මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ............................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය (නිල මුද්‍රාව යොදන්න) :——————————.
දිනය :——————————.

07-147

# පළාත් පාලන නිවේදන

**වලල්ලාවිට ප්‍රාදේශීය සභාව**

වරිපනම් බදු පැනවීම - 2011 වර්ෂය

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් 2011 ජුනි මස 21 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7-(1) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂයේ සිව්වැනි කාර්තුව සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද, එම කාර්තුව තුළ දී සමාන වාරිකයකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂයේ සිව්වැනි කාර්තුව සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු මුදල 2011 වර්ෂයේ ඔක්තෝබර් මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාල වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට හයක (6%) වට්ටමක් ගෙවනු ලැබේ.

උදේනි ප්‍රියංග අතුකෝරළ,
සභාපති,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව.

2011 ජුනි මස 22 වැනි දින,
වලල්ලාවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් අයකරනු ලබන ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල වාර්ෂික වටිනාකම මත එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් සියයට හයක (6) වරිපනමක් 2011 වර්ෂයේ අවසාන කාර්තුව පනවා අය කිරීමටත්, සහ ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී දෙසැම්බර් 31 යන දිනයෙන් අවසන් වන කාර්තුව තුළදී වාරිකයකින් ගෙවීමට විධාන කිරීමටත් වලල්ලාවිට ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

07-179

---

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින හා අංක 1663 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* (අ) කොටසේ පළකරනු ලැබූ වයඹ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 දිනැති අංක 1,703.18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද ".වාරියපොල ප්‍රාදේශීය සභාවේ අප්‍රසන්න අන්තරාදායක හා අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු සංචාරක වෙළඳාම, ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිළි කිරීම, ලැගුම් නිවාස හා නවාතැන් පලවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ වාරියපොල ප්‍රාදේශීය සභාව විසින් 2011.05.27 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ තීරණය කර ඇත.

ආනන්ද ජයලත්,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2011 ජුනි මස 21 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභාවේ දී ය.

07-245

---

**අක්කරපත්තු මහ නගර සභාව**

මහ නගර සභා ආඥාපනතේ 252 වැනි අධිකාරය - 267 වැනි වගන්තිය යටතේ දැන්වීම

**පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත යටතේ**

*තීරණය :*

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ අංක 02 වගන්තිය යටතේ පළාත් පාලන නිවාස ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 1981.01.20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *(අති විශෙෂ) ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටස මගින් ප්‍රකාශයට පත්කර ඇති අංකය I සිට LVII දක්වා වූ ආදර්ශ අතුරු ව්‍යවස්ථාව 2011.04.01 වැනි දින සිට අක්කරපත්තු මහ නගර සභාවේ බල සීමාව තුළ ක්‍රියාත්මක කිරීමට සභාව තීරණය කර ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. වයි. සලීම්,
කොමසාරිස්
මහ නගර සභාව, අක්කරපත්තුව.

මහ නගර සභාව,
අක්කරපත්තුව.

07-246

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.